රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/16
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2022 වර්ෂයේ සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන්ට වැටුප් ගෙවීම, පරිවාස වාර්තා හා අනෙකුත් ආයතනික කටයුතු සිදුකිරීම.</u>**

රැකියා විරහිත උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවාගනු ලැබූ අභ්‍යාසලාභීන් සඳහා මූලිකව 2022.01.03/ 2022.04.01 හා ඇතැම් අභ්‍යාසලාභීන්ට ඉන්පසුවද සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලබා දෙන ලදී. මෙම නිලධාරීන්ගේ වැටුප් ගෙවීම, පරිවාස වාර්තා සකස් කිරීම හා වෙනත් ආයතනික කටයුතු සිදුකිරීම පිළිබඳව උපදෙස් ලබා දෙන ලෙස විවිධ ආයතන විසින් ඉල්ලීම් යොමුවී තිබීම හේතුවෙන් මෙම උපදෙස් මාලාව නිකුත් කරනු ලැබේ.

**(i)** **<u>වැටුප් ගෙවීම</u>**

මෙම නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධව උපදෙස් මගේ අංක PS/GT/2020 (IIIවෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය මඟින් නිකුත් කර තිබුනද ඇතැම් නිලධාරීන් සඳහා 2022 වර්ෂය තුළදී හිමි විය යුතු හිඟ වැටුප් මේ වන විටත් හිමිවී නොමැති බවට මා වෙත තොරතුරු වාර්තා වී ඇත. ඉහත ලිපිය මඟින් දන්වා ඇති පරිදි හිඟ වැටුප් ගෙවීමේදී 2022.01.03/ 2022.04.01 දින සිට නිලධාරියා රාජකාරී භාර ගන්නා දිනයට පෙර දිනය දක්වා පූර්ව පුහුණු සේවා ස්ථානයේ අඛණ්ඩව පුහුණුව සඳහා වාර්තා කළ බව සනාථ කර ගැනීමට අදාළ සියලුම වාර්තා ගෙන්වාගත යුතු වන අතර එලෙස සේවයට/පුහුණුවට වාර්තා කර නොමැති දින පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් මඟින් සනාථ කරගැනීමෙන් පසු එම දිනයන් නිලධාරියාට හිමි වාර්ෂික නිවාඩු වලින් ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් නිලධාරියා සේවයට/පුහුණුවට වාර්තා කර නොමැති දින ගණන නිවාඩු වලින් ගැලපීමට නොහැකි බව පෙනී යන්නේ නම් (සේවයට/පුහුණුවට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් සාධාරණ හේතු ඉදිරිපත් කර නොමැති නම් හෝ හිතාමතාම සේවයට වාර්තා කිරීමෙන් වැළකී සිට ඇති බව පෙනී යන්නේ නම්) එම දින ගණන වැටුප් රහිත නිවාඩු දින ලෙස සැලකිය යුතුය.

ඒ අනුව නිලධාරියා වෙත ගෙවන ලද අභ්‍යාසලාභී දීමනා හෝ වැටුප් සමඟ ගලපා හිඟ වැටුප් පමණක් අදාළ රෙගුලාසි වලට අනුකූලව නිලධාරියා දැනට සේවය කරන සේවා ස්ථානය මඟින් ගෙවීම් කිරීමට වගබලා ගත යුතු ය.

**(ii)** <u>රාජකාරී භාර ගැනීම</u>

මගේ අංක PS/GT/2020 (IIIවෙළුම) හා 2022.01.07 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි 2009.02.20 දිනැති අංක 1589/30 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයට අනුව එහි 03 සහ 04 පරිශිෂ්ට ප්‍රකාර ආකෘති පත්‍ර බාගත කර ගැනීමට MISCO පද්ධතිය මඟින් එවකට අවස්ථාව සලසා දී තිබූ අතර එලෙස බාගත කරගනු ලැබූ 03 සහ 04 පරිශිෂ්ටවල මුද්‍රිත පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ගොනුගත කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. එලෙස අදාළ පරිශිෂ්ට බාගත කර පෞද්ගලික ලිපි ගොනුවල ගොනුගත කර නොමැති නිලධාරීන් රාජකාරි භාරගත් සේවා ස්ථාන වලින් 03 හා 04 පරිශිෂ්ඨ ප්‍රකාර මුද්‍රිත ආකෘතීන් සකස් කොට නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු වන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

තවද, නිලධාරියා සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ලිපියේ රාජකාරි සඳහා වාර්තා කරන ලද දිනය සඳහන් කළ යුතු ස්ථානයේ, නිලධාරියා/නිලධාරිනිය පත්වීම ක්‍රියාත්මක වන දින සිට රාජකාරි සඳහා වාර්තා කර ඇති බව තහවුරු වන සේ සංශෝධන සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

උදාහරණ : 01

- පත්වීම් දිනය - 2022.01.03
- රාජකාරි භාරගැනීම - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ........... හා ................. දිනැති ලිපියට අනුව 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022.03.01 දින රාජකාරී සඳහා වාර්තා කිරීම.

උදාහරණ : 02

- පත්වීම් දිනය - 2022.04.01
- රාජකාරි භාරගැනීම - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ........... හා ................. දිනැති ලිපියට අනුව 2022.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022.05.02 දින රාජකාරී සඳහා වාර්තා කිරීම.

එසේ වුවද ඉහත (i) උපඡේදයෙහි සඳහන් පරිදි අදාළ පත්වීම ක්‍රියාත්මක වන 2022.01.03/ 2022.04.01 දින සිට රාජකාරි භාර ගන්නා දින දක්වාම වැටුප් රහිත කාල සීමාවක් ලෙස සලකන නිලධාරීන් රාජකාරි භාර ගන්නා දිනය 2022.01.03/ 2022.04.01 දින සිට ක්‍රියාත්මක නොවිය යුතු වේ. එවැනි නිලධාරීන්ගේ පත්වීම හා රාජකාරි භාර ගැනීම ක්‍රියාත්මක වන්නේ රාජකාරි සඳහා වාර්තා කරන ලද දිනයයි.

**(iii)** <u>වර්යා සටහන සැකසීම හා වැටුප් වර්ධක ගෙවීම</u>

නිලධාරියාගේ වර්යා සටහනෙහි පත්වීම් ලිපිය අනුව පත්වීම සටහන් කිරීමේ දී ඉහත අංක (ii) යටතේ සඳහන් පරිදි මුල් පත්වීම් දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජකාරි භාරගෙන ඇති බව තහවුරු වන සේ නිවැරදිව සටහන් කළ යුතු අතර වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර වර්යා සටහනේ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

තවද, 2023 වර්ෂයට අදාල වැටුප් වර්ධක ගෙවීමේදී රාජකාරි සඳහා වාර්තා කිරීම ක්‍රියාත්මක වන දිනට අනුරූපීව වැටුප් වර්ධක ලබා දීමට කටයුතු කළ යුතුය.ඊට අදාළ උදාහරණ පහත පරිදි වේ.

උදාහරණ 01:- චර්යා සටහන

- රාජකාරි භාරගැනීම සටහන් කිරිම - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ....................... හා ................. දිනැති ලිපියට අනුව 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022.03.01 දින රාජකාරී සඳහා වාර්තා කිරිම.
- 2023 වැටුප් වර්ධක ගෙවීම සටහන් කිරීම
  - වැටුප් වර්ධක අනුමත කළ දිනට ඉදිරියෙන් "2023.01.03 දිනට හිමි වැටුප් වර්ධකය ගෙවීම" ලෙස සටහන් කළ යුතුය.

උදාහරණ 02 :

- රාජකාරි භාරගැනීම සටහන් කිරිම - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ....................... හා ................. දිනැති ලිපියට අනුව 2022.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022.05.22 දින රාජකාරී සඳහා වාර්තා කිරිම.
- 2023 වැටුප් වර්ධක ගෙවීම සටහන් කිරීම
  - වැටුප් වර්ධක අනුමත කළ දිනට ඉදිරියෙන් "2023.04.01 දිනට හිමි වැටුප් වර්ධකය ගෙවීම" ලෙස සටහන් කළ යුතුය.

එසේ වුවද ඉහත (i) උපඡේදයෙහි සඳහන් පරිදි අදාළ පත්වීම ක්‍රියාත්මක වන 2022.01.03/ 2022.04.01 දින සිට රාජකාරි භාර ගන්නා දින දක්වාම වැටුප් රහිත කාල සීමාවක් ලෙස සලකන නිලධාරීන් ඉහත (ii) උපඡේදයෙහි දක්වා ඇති පරිදි එවැනි නිලධාරීන්ගේ පත්වීම හා රාජකාරි භාර ගැනීම ක්‍රියාත්මක වන්නේ රාජකාරි සඳහා වාර්තා කරන ලද දින වන බැවින් ඒ අනුව චර්යා සටහනෙහි සටහන් තැබිය යුතු අතර වැටුප් වර්ධක ගෙවිය යුතු වන්නේද රාජකාරි සඳහා වාර්තා කරන ලද දිනයට අනුරූපීව වේ.

**(iv)** <u>අනෙකුත් ආයතනික කටයුතු</u>

තවද, මෙම නිලධාරීන්ගේ උපාධි සහතික අදාල විශ්ව විද්‍යාල වෙත යොමු කර කඩිනමින් සනාථ කරවා ගැනීමට සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් තම විශේෂ අවධානය යොමු කළ යුතුය.

එස්. අලෝකබණ්ඩාර
ඒකාබද්ධසේවා අධ්‍යක්ෂ ජනරාල්